# 10 වසර සිංහල සාහිත්‍ය කෙටි සටහන්

## 'ලෙන අතහැර යාම' දෙවෙනි අංකය
## මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ සිංහබාහු නාට්‍ය '1914-1996'



- නාට්‍යයක් යනු කුමක් ද ? නාට්‍යය යනු ශ්‍රව්‍ය දෘෂ්‍ය කලා මාධ්‍යයකි.

- නාට්‍යය යනු කුමක් ද යන්නට නිර්වචන

චතුර්විධ අභිනයෙන් යුක්ත රංගනය නාට්‍යය නම් වේ.
(භරතමුනි පඬිතුමා - නාට්‍ය ශාස්ත්‍රය)

නාට්‍ය වූ කලී බැලීමෙන් රස විඳීමට තිබෙන කාව්‍ය විශේෂයකි.
(මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර)

නාට්‍ය බලා රස විඳිය යුතු කාව්‍යය විශේෂයකි.
(මහා කවි කාලිදාස)

නාට්‍යය දැකීමෙන් ප්‍රේක්ෂකයාගේ ජීවන පැවැත්ම වෙනස් වේ.
(බර්නාඩ් ෂෝ)

- නාට්‍ය ශෛලිය යනු කුමක් ද ? නාට්‍යයක ප්‍රකාශන විලාසය හෙවත් ඉදිරිපත් කරන ආකරය යි.

- ප්‍රධානත ම නාට්‍ය ක්‍රම දෙක මොනවා ද ?

නාට්‍ය ධර්මී නාට්‍යය - ශෛලීගත නාට්‍යය
ලෝක ධර්මී නාට්‍යය - ස්වභාවික නාට්‍යය ශෛලීය

- සරච්චන්ද්‍රයන්ගේ නිර්මාණ

**නව කතා**

| | |
|---|---|
| මලගිය ඇත්තෝ | - 1959 |
| මළවුන්ගේ අවුරුදු දා | - 1965 |
| ලොකු පුතා | - 1962 |
| වල්මත් වී හසරක් නොදුටිමි | - 1962 |
| හෙට එච්චර කළුවර නෑ | - 1975 |
| විලාසිනියකගේ ප්‍රේමය | - 1988 |

**කෙටි කතා**

| | |
|---|---|
| කාලයාගේ ඇවෑමෙන් | - 1969 |
| මායා රූපය | - 1974 |
| මිතුරාගේ මරණය | - 1981 |
| රූප සුන්දරී | - 1984 |
| මිඩියා,ගෘහණිය හා උපාසිකාව | - 1994 |

**ගීත නාට්‍ය**

| | |
|---|---|
| මනමේ | - 1965 |
| සිංහබාහු | - 1961 |
| ලෝමහංස | - 1985 |

**ගීත නාට්‍ය**

| | |
|---|---|
| එලොව ගිහින් මෙලොව ආවා | - 1959 |
| පේමතෝ ජායතී සෝකෝ | - 1961 |

නන්දවංශ හාමුදුරුවෝ

සිසුළු පන්තිය නන්දවංශ

RmsnMaths - rmsnmath.blogspot.com

**ශාස්ත්‍රීය ග්‍රන්ථ**

සාහිත්‍ය විද්‍යාව
සිංහල නව කතා ඉතිහාසය හා විචාරය
කල්පනා ලෝකය
නාට්‍ය ගවේෂණ
අසම්පූර්ණ චාරිකා සටහන්

**අතීත කතා පුවත් ඇසුරින් රචිත සරච්චන්ද්‍ර සූරීන්ගේ නාටක**

| | | |
|---|---|---|
| සිංහබාහු | - | මහාවංශ කතා පුවත |
| මනමේ | - | චුල්ල ධනුද්දර ජාතකය |
| වෙස්සන්තර | - | වෙස්සන්තර ජාතකය |
| බව කඩතුරාව | - | ස්වර්ණ හංස ජාතකය |
| ලෝමහංස | - | මහා පදුම ජාතකය |
| පබාවතී | - | කුස ජාතකය |
| මහාසාර | - | මහාසාර ජාතකය |
| කදාවළලු | - | සේරිවාණිජ ජාතකය |
| ගොම්මන් කෙකිණිය | - | ස්වර්ණ හංස ජාතකය |

**ගීතාංග නාටක**

| | |
|---|---|
| පබාවතී | - 1952 |
| රත්තරන් | - 1954 |
| කදා වළලු | - 1959 |
| වෙල්ල වැහුම් | - 1960 |
| මහාසාර | - 1968 |
| ඒකට මට හිනා | - 1961 |
| බව කඩතුරාව | - 1989 |

**ගුවන්විදුලි නාටක**

වැල පලුවයි කපුටො රළයි
නැදෑයෝ
ගත්කරු පිස්සුව
ඈ නුවන් ලැබුවා

**පරිවර්තන**

ප්‍රන්ස කෙටි කතා (ඒ.පී.ගුණරත්න සමග)
රුසියන් කෙටිකතා (ඒ.පී.ගුණරත්න සමග)
මැණික් සාමි (ඒ.පී.ගුණරත්න සමග)

**ස්වයං චරිතාපදානය**

පිං ඇති සරසවි වරමක් දෙන්නේ

- **ලෙලන අතහැරෙ යාම සාහිත්‍ය කෙටි ප්‍රශ්න**

**1.** මෙම කොටස උපුටා ගත් නාටකය කුමක් ද ? සිංහබාහු නාට්‍යය

**2.** එම නාටකය නිර්මාණය කරන ලද්දේ කවුරුන් ද ? මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර සූරීන්

**3.** ඔහුගේ මුල් නාමය කුමක් ද ? යුස්ටස් රෙජිනෝල්ඩ් ද සිල්වා

**4.** ඔහුගේ උපන් දිනය හා උපන් ස්ථානය සඳහන් කරන්න 1914 ජුනි මස 03 දා රත්ගම දොඩන්දූවේ දී

**5.** එතුමා අධ්‍යාපනය ලැබූ පාසල් තුනක් නම් කරන්න.
ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලය
ගාල්ල සව්ත්ලන්ඩ් විද්‍යාලය
ගාල්ල ශාන්ත ඇලෝසියස් විද්‍යාලය

නන්දවංශ හාමුදුරුවෝ

6. එතුමාගේ මවගේ නම සහ පියාගේ නම සඳහන් කරන්න.
මව - ලිඩියා පින්තු මැතිණිය
පියා - චාල්ස් ෆ්‍රැන්සිස් ද සිල්වා මැතිතුමා

7. සිංහබාහු යන්නෙහි අර්ථය කුමක් ද ? සිංහයෙකුට බඳු බාහු ඇත්තේ ය යනුයි.

8. සරච්චන්ද්‍ර සූරීන්ගේ මුල් ම නාටකය හා එය නිර්මාණය වූ වර්ෂය සඳහන් කරන්න.
මනමේ නාට්‍ය 1956 දී

9. සිංහබාහු නාට්‍ය අයත් වන්නේ කුමන නාට්‍ය සම්ප්‍රදායට ද ? ශෛලීගත නාට්‍ය සම්ප්‍රදායට

10. සරච්චන්ද්‍ර සූරීන් ලද සම්මාන කිහිපයක් ඒ සම්මාන පිරිනැමූ රටවල් සමග ලියා දක්වන්න.
කුමාරන් අශාන් විශ්ව සම්මානය - භාරතය
රැමෝන් මැග් සෙසය සම්මානය - පිලිපීනය
ස්වර්ණ රජත සම්මානය - ජපානය

11. සිංහබාහු නාට්‍යයේ එන ප්‍රධාන චරිත කිහිපයක නම් ලියා දක්වන්න.
සිංහයා
සුප්පා දේවිය
සිංහබාහු
සිංහසීවලී

12. සිංහබාහු නාට්‍ය ප්‍රථම වරට රංග ගත වූ දිනය හා ස්ථානය නම් කරන්න.
1961 අගෝස්තු මස 31 වන දින - පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දී

13. සිංහබාහු නාට්‍යයේ ප්‍රථම දර්ශනය පැවැත් වූ දිනය හා ස්ථානය සඳහන් කරන්න
1961 සැප්තැම්බර් මස 30 වන දින - කොළඹ ලයනල් වෙන්ඩ්ට් රඟහලේ දී

14. සිංහබාහු නාට්‍යයේ එන ප්‍රධාන තේමා දෙක ලියන්න.
පිය පුතු ගැටුම හා පරම්පරා ගැටුම

15. සිංහබාහු නාට්‍යට වස්තුවිෂය වූ කතා පුවත කුමක් ද ?
සිංහල ජාතියේ උපත හා මහාවංශය

16. දහනව වන සියවසේ සිංහබාහු කතා පුවත කවියට නැගුණි.එම කාව්‍ය සංග්‍රහය හා රචකයා නම් කරන්න.
කෘතිය - සියබස් මල් දම
කතුවරයා - කිරම ධම්මානන්ද හිමි

17. චතුර්විධ අභිනය නම් කරන්න.
ආංගික අභිනය
සාත්වික අභිනය
වාචික අභිනය
ආහාර්ය අභිනය

18. ප්‍රධානත ම නාට්‍ය ක්‍රම දෙක නම් කරන්න.
ලෝක ධර්මී නාට්‍ය - ස්වභාවික
නාට්‍ය ධර්මී නාට්‍ය - ශෛලීගත

RmsnMaths - rmsnmath.blogspot.com

## 'ගුත්තිල වෙණ නද'
## වෑත්තෑවේ හිමියන් විසින් ලියන ලද ගුත්තිල කාව්‍ය

- **කෝට්ටේ සාහිත්‍ය යුගය පිළිබඳ කෙටි හැඳින්වීම**

කෝට්ටේ අගනුවර කරගෙන පැවති යුගයේ සාහිත්‍යය, කෝට්ටේ යුගයේ සාහිත්‍යය වශයෙන් හැඳින් වේ. (ක්‍රි.ව.) 1415 සිට, වසර එකසිය පනහක පමණ කාලයක්, මෙම යුගයට අයත් වන අතර, රජවරුන් දස දෙනෙකුගේ පමණ පාලන තන්ත්‍රයක් පැවතුන බව ද, එයින් හයවන ප්‍රාක්‍රමබාහු රජතුමාගේ කාලය තුළ විශාල සාහිත්‍ය පුනර්ජීවනයක් ඇති වූ බව ද, පෙනී යයි.හයවන පරාක්‍රමබාහු යුගයෙහි රට තුළ පැවති සාමකාමී හා සෞභාග්‍යමත් වාතාවරණය ද, රජතුමා සාහිත්‍යකාමියෙකු හා සාහිත්‍යධරයෙකු වීම ද, එනිසා ම විද්‍යාස්ථාන දියුණු වීම හා ශාස්ත්‍රෝන්නතිය ඇති වීම ද, ගිහි පැවිදි පඬිවරුන් වෙතින් මාහැඟි සාහිත්‍ය ගද්‍ය පද්‍ය කෘති ගණනාවක් රචනා වීම ද, යන කරුණු නිසා කෝට්ටේ යුගය සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය හැටියට විචාරකයෝ සලකති.

- **ගුත්තිල කාව්‍ය ලියූ යුගය හා කවියා හැඳින්වීම**

සවන පැරකුම්බා රජුගේ රාජ්‍ය කාලයේ, අවසන් වකවානුව තුළ දී, ලියන ලදැ යි සැලකෙන ගුත්තිල කාව්‍යය, තොටගමුවේ ශ්‍රී රාහුල හිමිගේ ශිෂ්‍යයෙකු වන, වෑත්තෑවේ හිමියන් විසින් රචිත ය.සත් කෝරළයේ, පහළ දොළොස් පත්තුවේ, වෑත්තෑවේ නම් ගමෙහි උපන් කතු හිමි, ගුරු ස්වාමීන් වහන්සේ කෙරෙහි කළකිරී, තමන් අකෘතඥයෙකු නො වන බව, ගුරු හිමිට ඇඟවීම සඳහා, ගුත්තිල කාව්‍යය රචනා කළ බව ජනප්‍රවාදවල සඳහන් වේ.

හලාවත ජයපාල මැතිඳුන්ගේ ආරාධනයෙන්, ලියන ලද මෙම කාව්‍යය, පන්සිය පනස් ජාතක පොතේ එන, දෙසිය හතලිස් දෙවන ජාතක කතාව වන, ගුත්තිල ජාතක වස්තුව විෂය කොටගෙන කවි 511 කින් නිමවා ඇත. පෙරදිග මහා කවීන්ට අනුව ගුත්තිල කාව්‍යය ඛණ්ඩ කාව්‍ය ගණයට අයත් ය. මෙහි ලක්ෂණ නම් සර්ග බෙදීමක් නැති කාව්‍ය වීමයි. ගුත්තිල කාව්‍යය ආරම්භ වන්නේ,

''සිය පින් සිරින් සරු
දෙසිස් ලකුණින් විසිතුරු
කෙලෙසුන් කෙරෙන් දුරු
වඳිම් මුනි උතුමන් තිලෝගුරු''

වායු ගණය මුල් කොට කවි කළ විට ඇතට ගසාගෙන යන බව කාව්‍ය ශාස්ත්‍රයේ නියමය බව වියත් මතය වේ.වෑත්තෑවේ හිමි ඒ බව දැන දැන ම ගුත්තිල කාව්‍ය නිර්මාණය කළේ සාම්ප්‍රදායික කාව්‍ය නිර්මාණය අභිබවා ස්වාධීන මගක පියමං කිරීමට දැක්වූ අභිරුචිය පෙන්නුම් කිරීමට ය.

- **සාහිත්‍ය කෙටි ප්‍රශ්න මගින් 'ගුත්තිල වෙණ නද' පාඩම හඳුනා ගනිමු.**

1. ගුත්තිල වෙණ නද පාඩම උපුටා ගැනුණේ කවර ග්‍රන්ථයකින් ද? ගුත්තිල කාව්‍යයෙනි

2. ගුත්තිල කාව්‍ය රචනා කළ සාහිත්‍ය යුගය කුමක් ද? කෝට්ටේ යුගය

3. ගුත්තිල කාව්‍යය රචනා කළේ කවරෙක් ද? වෑත්තෑවේ හිමි

4. ගුත්තිල කාව්‍යය රචනා කිරීමට ආරාධනය කළේ කවරෙක් ද? සළාවත ජයපාල මැතිඳුන්

5. ගුත්තිල කාව්‍යයට මූලාශ්‍ර වූයේ කුමක් ද? පන්සිය පනස් ජාතක පොතෙහි එන ගුත්තිල ජාතකය

6. ගුත්තිල කාව්‍යය රචකයාගේ වෙනත් නිර්මාණ මොනවා ද? තොටමුණ

7. ගුත්තිල කාව්‍යයේ ඇතුළත් පද්‍ය ගණන කොපමණ ද? පද්‍ය ගණන 511කි.

8. ගුත්තිල කාව්‍යය හැර වෙනත් ජාතක කතා කාව්‍ය රැසක් අපට හමුවේ. එයින් කිහිපයක් ලියා දක්වන්න.

සසදාවත - පොළොන්නරු යුගය
සඳකිඳුරු දා කව - කුරුණෑගල යුගය
මුවදෙව්දාවත - පොළොන්නරු යුගය
කාව්‍යශේඛරය - කෝට්ටේ යුගය
කව්සිළුමිණ - දඹදෙණි යුගය

9. ගුත්තිල කාව්‍යයේ ඇතුළත් රසවත් වර්ණනා කිහිපයක් නම් කරන්න.

උදේනිපුර සැණකෙළිය
සුරඟන රැඟුම
ගුත්තිල පඬිතුමාගේ දෙව්ලොව ගමන් වැණුම

10. මූලාශ්‍ර ජාතක කතාවට බැහැරින් ගුත්තිල කාව්‍යය රචනා කිරීමේ දී යොදාගෙන ඇති අතිරේක තොරතුරු ඇතුළත් වර්ණනය කුමක් ද? උදේනිපුර සැණකෙළිය වැනුම

11. ගුත්තිල ජාතකය දේශනා කරනු ලැබ ඇත්තේ කවුරුන් උදෙසා ද? දේවදත්ත ස්ථවිරයන් අරභයා

12. ගුත්තිල කතුවරයා විසූ යුගයේ ප්‍රචලිත ගුරුකුල දෙක නම්කරන්න.

තොටගමුව ගුරුකුලය
වීදාගම ගුරුකුලය

13. ගුත්තිල පඬිවරයාට සමකාලීන පැවිදි පඬිවරු දෙදෙනකු නම් කරන්න.

වීදාගම මහා මෛත්‍රී හිමි
තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

14. ගුත්තිල කාව්‍යයෙහි දක්නට ලැබෙන විරිත් කිහිපයක් නම් කරන්න.

සමුද්‍රඝෝෂ විරිත
පෙද හෙවත් පදක විරිත

15. ගුත්තිල කතුවරයාගේ ආචාර්යවරයා කවුරුන් ද? තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

16. වෑත්තෑවේ හිමියන්ගේ ගුරුහිමි විසින් රචිත ග්‍රන්ථ කිහිපයක් නම් කරන්න.

සැළලිහිණි සන්දේශය
පරෙවි සන්දේශය
කාව්‍යශේඛරය

RmsnMaths - rmsnmath.blogspot.com

**17.** කෝට්ටේ යුගයේ රචිත පංච මහා සංදේශ කාව්‍යයන් හා ඒවායේ කතුවරු නම් කරන්න.

සැළලිහිණි සන්දේශය - රාහුල හිමි
පරෙවි සන්දේශය - රාහුල හිමි
කෝකිල සන්දේශය - ඉරුගල්කුලතිලක හිමි
හංස සන්දේශය - වීදාගම මෛත්‍රී හිමි
ගිරා සන්දේශය - කර්තෘ අඥාතය

**18.** කෝට්ටේ යුගයේ රචිත මහා කාව්‍යය හා එහි කතුවරයා නම් කරන්න.

කෘතිය - කාව්‍යශේඛරය
කතුවරයා - තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

**19.** ගුත්තිලය රචනා වන්නේ කුමන රජ දවස ද? ගුත්තිලයේ බස්වහර කෙබඳු ද?

සවැනි පැරකුම්බා රජ දවස
ජනකවියට ආසන්න සරල බස් වහර

**20.** ගුත්තිල කතුවරයාගේ ගම් පියස කුමක් ද?

වයඹ පළාතේ සත් කෝරළයේ පහළ දොළොස්පත්තුවේ වැත්තෑව නම් ගම

**21.** ගුත්තිල කාව්‍ය ආරම්භ වන්නේ කුමන කාව්‍ය ගණයෙන් ද?

ලඝු අකුරු දෙකකින් හා ගුරු අකුරකින් යුත් වායු ගණයෙන්

චන්ද්‍රවංශ හාමුදුරුවෝ

# 'සතර කන් මන්ත්‍රණය' උම්මග්ග ජාතකය

- **උම්මග්ග ජාතකය**

උමගේ කතාව ඇතුළත් ජාතකය යන අදහසින් උම්මග්ග ජාතකය හෙවත් උමංදාව නම කතාවට ලැබී ඇත.ජාතක පොතෙහි දී දීර්ඝතම ජාතක කතාව මෙය වේ. උමංදාව බමුණන් හා බමුණු දහම් තර්කශ උපහාසයට භාජනය කරන කථාවකි.පැරණි භික්ෂූන් වහන්සේලා රජුන්ගේත් ඔවුනට අනුබල දුන් බමුණන්ගේත් දොස් නිර්දය ලෙස විචාරය කළ බව උම්මග්ග ජාතකයෙන් හෙළි වේ.

මෙය බලවත් සතුරු ප්‍රිඩාවකට ලක් වූ තම රජුන්, රටත් තම අසිරිමත් නුවණේ මහිමයෙන් බේරාගත් අසහාය වීර පුරුෂයෙකු පිළිබඳ රසබර කතා පුවතකි.මෙහි එන මහෞෂධ නම් පඬිවරයාගේ අසහාය බුද්ධි මහිමය නිසා ඔහු කා අතරත් ජනප්‍රිය චරිතයකි.බෝසත් මහෞෂධ පඬිවරයාගේ ප්‍රඥා පාරමිතාව හෙවත් ප්‍රඥාවේ මහිමය විදහා දැක්වීම මේ කථාව ලිවීමේ අරමුණ වී ඇත.සතර කන් මන්ත්‍රණය එයින් උපුටා ගත් කොටසකි.

- **සතර කන් මන්ත්‍රණය පාඩම සාහිත්‍ය කෙටි ප්‍රශ්න.**

1. සතර කන් මන්ත්‍රණය ඇතුළත් ජාතක කතාව කුමක් ද? උම්මග්ග ජාතකය දීර්ඝතම - ජාතක කථාවයි.

2. උම්මග්ග ජාතකය ඇතුළත් වූ ග්‍රන්ථය කුමක් ද? පන්සිය පනස් ජාතක පොත

3. (අ) ජාතක පොත ලියැවුණු යුගය සඳහන් කරන්න. කුරුණෑගල යුගය
   (ආ) ඒ කුමන රජු දවස ද? සිව්වන පැරකුම්බා රජු දවස

4. ජාතක පොතෙහි ඇතුළත් වූ කථා ගණන කොපමණ ද? ජාතක කථා 547කි.

5. (අ) ජාතක පොතට මූලාශ්‍රය වූ පාලි ග්‍රන්ථය කුමක් ද? පාලි ජාතකට්ඨ කථාව
   (ආ) එහි රචකයා කවු ද? බුද්ධඝෝෂ හිමි

6. සිංහල ජාතක කථාවන්හී ආකෘතියේ පෙනෙන ලක්ෂණ තුන මොනවා ද?
   - වර්තමාන කථාව
   - අතීත කථාව
   - චරිත සමෝධානය

7. කුරුණෑගල අවධියේ රචනා වූ වෙනත් ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
   - සඳකිඳුරු දා කව
   - සිංහල බෝධි වංසය
   - දළදා පූජාවලිය
   - ධාතු වංසය
   - දළදා සිරිත

RmsnMaths - rmsnmath.blogspot.com

**8.** ජාතක කථා ඇසුරෙන් බිහි වූ ගී කාව්‍ය දෙකක් නම් කරන්න.

සසදාවත
මුවදෙව්දාවත
කව්සිළුමිණ

**9.** ජාතක කථා මූලාශ්‍ර වූ වෙනත් ග්‍රන්ථ දෙකක් දක්වන්න.

දහම් සොඬ දා කව
කාව්‍යශේඛරය
ගුත්තිල කාව්‍ය
සඳකිඳුරු දා කව
කුස දා කව
වෙසතුරු දා කව

**10.** වෙන ම ග්‍රන්ථ වශයෙන් පැවති ජාතක කථා දෙකක් සඳහන් කරන්න.

උම්මග්ග ජාතක්‍ය
උම්මාදන්ති ජාතකය
එළු උමංදාව

**11.** උම්මග්ග ජාතක කථාව රචනා කිරීමේ අරමුණ සඳහන් කරන්න.

ඖෂධ පණ්ඩිතව උපන් අප මහා බෝසතුන්ගේ ප්‍රඥා මහිමය ප්‍රකට කිරීම සඳහා

නන්දවංස හාමුදුරුවෝ

## මුනි සිරිපා සිඹිමින්නේ
## ටිබෙට් ජාතික එස්.මහින්ද හිමි.

- **ටිබෙට් ජාතික එස්.මහින්ද හිමියන් පිළිබඳ කෙටියෙන්.**

1901 වසරේ දී හිමාලය කඳුවැටියට අයත්, ටිබෙට් ප්‍රදේශයට යාබද සිකීම් නුවර ජන්මලාභය ලද ඇස්.කේ.ටෂිනම්ගාල් නම් අය, පසුකලෙක ටිබෙට් ජාතික එස්.මහින්ද හිමි නමින් ලෝකප්‍රකට විය.ජාතිය සිංහල නොවුවත්, සිංහලයන් තුළවත් නොතිබූ ජාතික හැඟීම,ජාතික අනුරාගය වේගවත් අසිපතක් මෙන් පහළ විය.

ක්‍රි.ව. 1914 දී තුදුස් වියේ පසු වූ ටෂිනම්ගාල් කුමරුවා ලංකාව බලා පැමිණියේ, ජර්මන් ජාතික ඥානාතිලෝක හිමියන් සමග ය.ඉගෙනීමට ඉතා සුරයෙකු වූ ඔහු ලංකාවට පැමිණ කෙටි කලකින් මහා බෝධි විද්‍යාලයට ඇතුළත් විය.එහි දී ඉංග්‍රීසි දැනුම ද ලබා ගන්නට හෙතෙම උනන්දු විය.එහි දී ඉංග්‍රීසි දැනුම ද ලබා ගන්නට හෙතෙම උනන්දු විය.ඒ අතරතුර පැවිදි බිමට ඇතුළත් වූ හෙතෙම ඒ්මහින්දඵ යන නාමයෙන් ප්‍රසිද්ධියට පත් විය.සසුන්ගත වීමෙන් අනතුරුව උන්වහන්සේ දොඩම්දූවේ ශෛල බිම්බාරාම සරස්වතී මණ්ඩප පිරිවෙණෙහි නවාතැන් ගත්හ.එහි සිට අලුත්ගම ශ්‍රී ශීලක්ඛන්ධ නායක ස්වාමීන්වහන්සේ සෙවණෙහි සිංහල,පාලි,සංස්කෘත යන භාෂා ශාස්ත්‍රයන් ප්‍රගුණ කළහ.බුද්ධ ධර්මය පිළිබඳව ද ඉගෙන ගත්හ.

සාමණේර කාලයේ දී ම චතුර ධර්ම කථිකයෙකු ලෙස ප්‍රසිද්ධියට පත් වූහ.අනතුරුව දොඩන්දූව ශෛලබිම්බාරාමයේ සිට රත්මලානේ පුරාණ රාජ මහා විහාරාධිපති ඉන්ද්‍රජෝති නායක මාහිමිපාණන් වහන්සේගේ සිසුවෙකු ලෙස උපසම්පදාව ලැබූහ.උපසම්පදාව ලැබීමෙන් පසුව උන්වහන්සේ ශ්‍රී ධර්මාරාම පිරිවෙනෙහි අධ්‍යාපනය ලබා ප්‍රාචීන ප්‍රාරම්භ මධ්‍යම යන විභාගවලින් සමත් වූහ.එතැන් සිට උන්වහන්සේ කොළඹ ආනන්ද මහා විද්‍යාලයේ ගුරුවරයෙකු ලෙස පත් වූහ.
අධිරාජ්‍යවාදීන්ගේ ග්‍රහණයට ලක්ව, කිසියම් පසුබෑමක සිටි සිංහල ජනතාවට සිය අභිමානවත් අතීතය මතක් කර දී,ජනතාව තුළ පිබිදීමක් ඇති කිරීමට උන්වහන්සේ සිය දක්ෂතාවන් හැකියාවන් උපයෝගී කර ගත්හ. ඉතා චතුර ධර්ම කථිකයෙකු වූ උන්වහන්සේ ධර්මදේශනාවන් තුළින් ජන හදවත් අවදි කිරීමට පියවර ගත්හ.එමෙන් ම ජාති හිතෛෂී හැඟීම්වලින් ඉතා ඉහළ තැනක සිටි උන්වහන්සේ, සිය තෙලිතුඩ මෙහෙය වූයේ ජාතියේ උදාසීන බව දුරලීමට ජාතියට පණ දීමට කවි ලිවීමට ය.

- **මුනි සිරිපා සිඹිමින්නේ සාහිත්‍ය කෙටි ප්‍රශ්න.**

1. ටිබෙට් ජාතික එස්.මහින්ද හිමි අයත්වන කාව්‍ය යුගය කුමක් ද?
   කොළඹ යුගයේ මුල් පරපුරේ කවියෙකි

2. උන්වහන්සේ උපත ලද රට කුමක් ද? 1901 ටිබෙට් රටෙහි සිකීම් දේශයේ

3. එස්.මහින්ද හිමියන්ගේ ගිහි නාමය කුමක් ද? එස්.කේ. ටෂිනම්ගාල්

4. එස්.මහින්ද හිමියන් මෙරට අධ්‍යාපනය ලැබූ ආයතන දෙකක් නම් කරන්න.
   විද්‍යෝදය මහ පිරිවෙන හා මහාබෝධි විද්‍යාලය

**5.** එස්.මහින්ද හිමි වයස අවුරුදු 12 දී, මෙරටට පැමිණියේ තවත් දෙදෙනකු සමග ය.ඔවුන් දෙදෙනාගේ නම් සඳහන් කරන්න.
පැවිදි සොහොයුරු එස්. පුණ්ණජි හිමි
ජර්මන් ජාතික ඤාණතිලෝක හිමි

**6.** කොළඹ යුගයේ මුල් (වැඩිහිටි)පරපුරට අයත් කවියන් තිදෙනකු නම් කරන්න.
ආනන්ද රාජකරුණා
ජී.එම්. පෙරේරා
කුමාරතුංග මුනිදාස

**7.** කොළඹ යුගයේ මුල් පරපුරේ කවීන්ට වස්තු විෂය වූ තේමාවන් දෙකක් දක්වන්න.
ජාතික විමුක්තිය - සොබාව සෞන්දර්යය
බුදුගුණ වර්ණනා - අතීත ශ්‍රී විභූතිය

**8.** එස්.මහින්ද හිමියන් අපවත් වූයේ කවදා ද? ක්‍රි.ව. 1951 මාර්තු මස 16 වන දින

**9.** එස්.මහින්ද හිමියන්ගේ නිමර්ාණ බෙදා දැක්විය හැකි තේමාවන් 03 නම් කරන්න.
ළමයින් උදෙසා ලියූ කවි (කවමුතු, කවමිණ, ළමා කවි කළඹ)
දේශානුරාග හා ජාතිකාභිමානී කවි (නිදහසේ දැහැන, ලංකා මාතා, නිදහස් මන්ත්‍රය
බුද්ධාභිවන්දනා කවි (කුසුමාඤ්ජලී)

**10.** මිනි සිරිපා සිඹිමින්නේ පැදි පෙළ ඇතුළත් මුල් කෘතිය කුමක් ද?
දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල

**11.** එස්.මහින්ද හිමි රචනා කළ ගද්‍ය කෘති දෙකක් නම් කරන්න.
දෙවන රාජසිංහ චරිතය
රාහුල කුමාරයා

**12.** (ක්‍රි.ව. 1934-1936) කාල වකවානුව තුළ දී එස්.මහින්ද හිමියන් ආචාර්යවරයෙක් වශයෙන් සේවය කළ විද්‍යාලය නම් කරන්න.
කොළඹ ආනන්ද විද්‍යාලය

ඉසුරු හාමුදුරුවෝ

# බැද්දේගම – Village in the jungle

- **බැද්දේගම නවකතාවෙහි මුල් කතුවරයා.**

බැද්දේගම නමින් සිංහලට පෙරලා ඇත්තේ, ඉංග්‍රීසි ජාතික ලෙනාඩ් වුල්ෆ් නම් පරිපාලන නිලධාරියා විසින් 1913 දී රචිත Village In The Jungle නම් ඉංග්‍රීසි නව කතාව යි. 1980 නොවැම්බර් මස 25 වන දින ලන්ඩනයේ කොන්සින්ටන් නුවර දී උපන් වුල්ෆ්,උසස් අධ්‍යාපනය ලැබ, අනතුරු ව ලංකාවට පැමිණ,සිවිල් නිලධාරියෙකු ලෙස පත්වීම් ලැබ,1904 සිට යාපනය හා මහනුවර දිස්ත්‍රික්කවල සේවය කොට,1906 දී හම්බන්තොට දිස්ත්‍රික්කයේ පරිපාලන නිලධාරියා ලෙස කටයුතු භාර ගත්තේ ය. 1911 දී නැවත එංගලන්තයට ගොස් ඇඩ්ලින් වර්ජිනියා ස්ටෙෆන් මෙනවිය සමග විවාපත් වූ ඔහු,1913 දී 'Village In The Jungle' නම් කෘතිය ලියුවේ, ලංකාවේ දී ලත් අත්දැකීම් සම්භාරය පාදක කරගෙන ය. ඔහු ලියූ මෙම කෘතිය තුළ ගැමි දිවියෙහි සැබෑ ස්වරූපය අපූර්වත්වයෙන් දිග හැරේ. මෙම කෘතිය 'බැද්දේගම' නමින් සිංහලට අනුවර්තනය කළේ, ඒ.පී.ගුණරත්න මහතා ය. ඒ (ක්‍රි.ව.1949) දී ය. පරිච්ඡේද 10 න් හා මුද්‍රිත පිටු 247 න් සමන්විත මෙම කෘතිය ගැමි දිවිය පිළිබඳ අපූරු විවරණයක් සපයන්නකි.

- **හා බැද්දේගම මුල් කෘතිය පිළිබඳ උගතුන්ගේ අදහස්**

''ඒ.පී. ගුණරත්න මහතා විසින් ව්‍යවහාර කරන ලද මටසිලිටු වාග්මාලාව වනාහී මේ නවකතාවෙහි ස්වභාවිකත්වයට අතිශයින් තුඩු දෙන්නකි.ඔහු විසින් උපයෝගී කොටගෙන තිබෙන සරල, සෘජු අලංකාර රහිත වචන විලාසය වනාහි මුල් කතාවෙහි තාත්වික රස සමූහය උද්වහනය කිරීමෙහිලා අතිශයින් යෝග්‍ය වූ මාර්ගයක් බව මේ පරිවර්තනය මුල් පොත සසඳන්නෙකුට පෙනී යනු නිසැකය.''

**බැද්දේගම ප්‍රස්තාවනාව**

''පෙරදිග ඇතැම් ජනයාගේ ජීවිතය පිළිබඳ පුදුම විවරණයකි.''

**ස්පෙක්ටර් පුවත්පත**

''බැද්දේගම වනාහී අතිශයින් ප්‍රසංසනීය වූ ද මනහර වූ ද කෘතියකි.එහි අපට හමු වන්නේ නොඇසූ විරූ චරිත විශේෂයන් ය.අපේ ගෞරවය ද, අනුකම්පාව ද ඔවුන්ට එකවර ම හිමි වේ.'

**මෝර්නිංග් පෝස්ට් පුවත්පත**

''මේ පරිවර්තනය අමුතු ජීවමාන ස්වරූපයක් ගනියි.භාෂා විලාසය හැකිතාක් කතා ව්‍යවහාරයට ළං කිරීමට තැත් කරන ලද බව පැහැදිලි ය.''

**මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර**

''වුල්ෆ් මහතා අමරණීය කතාවක් ලියා තිබේ.ප්‍රබන්ධ කතාවන්ගෙන් සිදුවිය හැකි උසස් සේවයට මෙය කදිම නිදසුනකි.''

**ලන්ඩන් ටයිම්ස් පුවත්පත.**

RmsnMaths - rmsnmath.blogspot.com

**ඒ.පී. ගුණරත්න මහතා විසින් සිදු කළ පරිවර්තන.**

| මුල් කෘතිය | මුල් කෘතියේ කතුවරා | **පරිවර්තන** කෘතිය | **පරිවර්තන** කෘතියේ කතුවරයා |
|---|---|---|---|
| The Monkey | චූ වෙං එන් | වානරයා | ඒ.පී.ගුණරත්න |
| Savage Sanctuary | ආර්.එල්.ස්පිටල් | වන සරණ | ඒ.පී.ගුණරත්න |
| Vanished Trails | ආර්.එල්.ස්පිටල් | මැකී ගිය දඩමං | ඒ.පී.ගුණරත්න |
| Where The White | ආර්.එල්.ස්පිටල් | සුදු ගෝනා | ඒ.පී.ගුණරත්න |

**ලෙනාඩ් වුල්ෆ් ලියූ ස්වයං චරිතාපදාන.**

- Showing
- Growing
- Beginning Again
- Downhill All The Way
- The Journey Not The Arrival
- Matters

**ලෙනාඩ් වුල්ෆ් ලියූ වෙනත් කෘති.**

- The Wise Virgins (1914) නව කතා
- The Hotel නාට්‍ය
- Stories From The East කෙටිකතා

- **බැද්දේගම පාඩම සාහිත්‍ය කෙටි ප්‍රශ්න.**

1. VILLAGE IN THE JUNGLE කෘතියෙහි කතුවරයා නම් කරන්න. **සිඩ්නි ලෙනාඩ් වුල්ෆ්**

2. එම කතුවරයා සරණ පාවා ගත් ඉංග්‍රීසි සාහිත්‍යයේ ප්‍රකට ලේඛිකාව කවු ද?
   **ඇඩ්ලින් වර්ජිනියා ස්ටෙෆන් මැතිණිය**

3. VILLAGE IN THE JUNGLE කෘතිය සිංහලට පරිවතර්නය කළේ කවරෙක් ද? පරිවතර්නයෙන් පසු එම කෘතිය හැඳින් වූ නම කුමක් ද?
   **ඒ.පී. ගුණරත්න සූරීන්**
   **බැද්දේගම**

4. VILLAGE IN THE JUNGLE කෘතිය ප්‍රථමවරට පළ වූ වර්ෂය කුමක් ද? **ක්‍රි.ව. 1913 දී**

5. VILLAGE IN THE JUNGLE කෘතිය බැද්දේගම යන නමින් පසු ව පරිවතර්නය කළ වර්ෂය කුමක් ද? **ක්‍රි.ව. 1943 දී**

6. බැද්දේගම නව කතාවේ පරිච්ඡේද ගණන කොපමණ ද? **පරිච්ඡේද දහයකි.**

7. බැද්දේගම නවකතාව කිනම් දෘෂ්ටිකෝණයකින් ඉදිරිපත් කෙරේ ද? **ප්‍රථම අපුරුෂ දෘෂ්ටිකෝණය**

8. මෙම නවකතාවේ සඳහන් ගම්මානය අයත් පළාත හා දිස්ත්‍රික්කය කුමක් ද?
දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කය

9. බැද්දේගම අනුවතර්කයාගේ වෙනත් පරිවර්තන කෘති දෙකක් නම් කරන්න.
මැකී ගිය දඩමං, වන සරණ, සුදු ගෝනා

10. ඉංග්‍රීසි ජාතික ලෙනාඩ් වුල්ෆ් මෙරට පැමිණ සිවිල් සේවයේ නියැළුණු දිස්ත්‍රික්ක තුනක් දක්වන්න.
යාපනය දිස්ත්‍රික්කය
මහනුවර දිස්ත්‍රික්කය
හම්බන්තොට දිස්ත්‍රික්කය

11. බැද්දේගම නව කතාවේ ඔබට ඉගෙනීමට නියමිත පරිච්ඡේදය නම් කරන්න. 09 වෙනි පරිච්ඡේදය

12. බැද්දේගම නව කතාවේ එන සිළිඳුගේ නිවුන් දරුවන් දෙදෙනාගේ නම් ලියා දක්වන්න.
හින්නි හාමි
පුංචි මැණිකා

13. බැද්දේගම නව කතාවේ එන චරිත කිහිපයක නම් ලියා දක්වන්න.
බබුන්
සිළිඳු
පුංචි රාල
හින්නි හාමි
පුංචි මැණිකා
කරලිනා හාමි
බබෙහාමි ආරච්චි

14. බැද්දේගම වැනි නව කතා ගණයට අයත් මෙරට ජන ජීවිතය පිළිබඳ ලියැවුණු කෘති දෙකක් නම් කරන්න.
Jungle tide - ජෝන් ස්ටිල්
Golden island - වෙනිස් ක්ලාක්

RmsnMaths - rmsnmath.blogspot.com

# ගංගාවේ සංගීතය   එච්.එම්. කුඩලිගම



- එච්.එම්.කුඩලිගමයන්ගේ කාව්‍ය නිර්මාණ

| පද්‍ය සංග්‍රහ | | |
|---|---|---|
| ඈ | කුණාටුව | එකමත් එක රටක |
| ගංගාවේ සංගීතය | ගැහැණිය | මහදැන මුත්තා |
| සිරිමලී | කැළල මැකීම | කොටි වලිගය |
| මතක සටහන් | | හිවල් මූණ |

- **සාහිත්‍ය කෙටි ප්‍රශ්න.**

1. ගංගාවේ සංගීතය නම් පද්‍ය පන්තියේ රචකයා නම් කරන්න. එච්.එම්. කුඩලිගම

2. ගංගාවේ සංගීතය නම් පද්‍ය නිමර්ාණයෙහි රචකයා අයත් වන සාහිත්‍ය යුගය කුමක් ද?
   කොළඹ යුගයේ දෙවන කවි පරපුර

3. එම කවියාට සමකාලීන කවියන් දෙදෙනකු නම් කරන්න.
   විමලරත්න කුමාරගම මහතා
   පී.බී. අල්විස් පෙරේරා මහතා
   චන්ද්‍රරත්න මානවසිංහ මහතා

4. ඔහු ලියූ පද්‍ය කෘති කිහිපයක නම් ලියන්න.
   ඈ
   සංවාදය
   කුණාටුව
   එකමත් එක රටක

5. කාව්‍ය රචනාවල දක්නට ලැබෙන විශේෂත්වය අනුව කොළඹ යුගයේ කවියන් බෙදා දක්වන කොටස් හතර නම් කරන්න.
   කොළඹ යුගයේ මුල් පරපුරට අයත් වැඩිහිටි කවි පරපුර
   කොළඹ යුගයේ දෙවන කවි පරපුර
   හෙළහවුලේ කවියන්
   නිසඳැස් කවියන්

6. කොළඹ යුගයේ මුල් පරපුරට හා දෙවන පරපුරට අයත් කවියන් දෙදෙනකු බැගින් ලියා දක්වන්න.
   **මුල්පරපුර** - ආනන්ද රාජකරුණා, පියදාස සිරිසේන, එස්.මහින්ද හිමි
   **දෙවන පරපුර** - සාගර පලන්සූරිය, පී.බී. අල්විස් පෙරේරා

7. "රෝස මලේ නටුවෙ කටු" යන ඉතා ජනප්‍රිය කවියෙහි නිමර්ාණකරු කවරෙක් ද?

ආනන්ද රාජකරුණා මහතා

8. කොළඹ යුගයේ දෙවන කවි පරපුරට අයත් කාලය ලෙස පිළිගැනෙන කාලය වන්නේ

ක්‍රි.ව. 1930 සිට 1960 දක්වා කාලය

9. ගංහාවේ සංගීතය පැදි පෙළ ඇතුළත් පද්‍ය කෘතිය කුමක් ද? ඈ - පද්‍ය කෘතිය

10. කොළඹ යුගයේ ප්‍රකට වූ කවි සංගම් දෙකක් නම් කරන්න.

අගනුවර තරුණ කවි සමාජය

සමස්ත ලංකා සිංහල කවි සම්මේලනය

11. රවීන්ද්‍රනාත් තාගෝර් කවියාගේ "**අහඹු කුරුල්ලෝ**" නිර්මාණයට බෙහෙවින් සමාන වන පරිදි කුඩලිගම කවියා ලියූ කාව්‍ය නිර්මාණය කුමක් ද? මතක සටහන්

චන්ද්‍රවංශ හාමුදුරුවෝ

RmsnMaths - rmsnmath.blogspot.com